# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2015 ජුලි මස 07 වන දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2015.06.23 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/VI (1) /15/24)

අ. i. බප /කැල/ ක්‍රිස්තුරාජ විද්‍යාලේ ගොඩනැගිලි හා ඉඩමෙන් 2/3 කට ආසන්න ප්‍රමාණයක් දිස්ත්‍රික් 306/බී ජාත්‍යන්තර සිංහ සමාජයට බදු දී ඇති බව ඔබ තුමා දන්නේද?

ii එම බදු කාලය පසුගිය වසරේ අවසන්ව ඇති බව ඔබතුමා දන්නේද?

iii මෙම ඉඩම හා ගොඩනැගිලි නැවත පාසලට පැවරීමට බස්නාහිර පළාත් සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් 2015.03.14 වන දිනත් කැලණිය කලාපයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ(පාසැල් පරිපාලන හා සේවා) 2015.02.16 දිනත් නිර්දේශ කර ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ආ i. දෙමව්පියන් විදුහල්පතිතුමන් හා අධ්‍යාපන නිලධාරීන් දිගින් දිගටම ඉල්ලීම් කර තිබියදී මේ වනතෙක් මෙම ඉඩම හා ගෙඩනැගිලි පාසල වෙත නැවත පවරා දීමට පියවර ගෙන නැත්තේ කුමන හේතුවක් මතද?

ii. මේ වනවිට පාසලේ ප්‍රාථමික අංශය පවත්වාගෙන යාමට ඉඩ්රිව ඇත්තේ පර්චස් 20 ක පමණ සීමිත ඉඩක් බැවිනුත්, ගොඩනැගිලි අබලන් බැවිනුත්, මෙම ඉඩම හා ගොඩනැගිලි නැවත පාසල වෙත පවරා දීමට පියවර නොගන්නේ මන්ද?

02. ගරු මංජු ශ්‍රී අරංගල - විපක්‍ෂනායකතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්‍ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/VI (1) /15/26)

අ. බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත පසුගිය රජයේ ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍යාංශය මගින් (ගැල්වනයිස්) ජී.අයි.පයිප්ප ලබාදී ඇති බව ඔබතුමා දන්නේද?

ආ. ඒ අනුව හෝමාගම ප්‍රාදේශීය සභාවට කොපමණ (ගැල්වනයිස්) ජී.අයි.පයිප්ප සංඛ්‍යාවක් ලබාදී තිබුණේද? ඒ කුමන කරුණක් සඳහාද?

ඇ. දැනට එම (ගැල්වනයිස්) ජී.අයි.පයිප්ප ප්‍රාදේශීය සභාව සතුව තිබේද?

ඈ. ඒ කොපමණ සංඛ්‍යාවක්දැයි සඳහන් කරන්නේද?

ඉ. එසේ සභාව සතුව නැත්නම් ඒ මන්ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. පොදු කටයුතු

01. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්‍ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප) විසින් පිළිගන්වනු ලබන ප්‍රඥප්තිය.

"බස්නාහිර පළාතේ 2015 අංක ........... දරණ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය."

(පළමුවර කියැවීම)

[2014 අංක 04 දරණ ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 06 දරණ බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරම සදහා වු ප්‍රඥප්තියකි.]

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

### 01. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා:

"බස්නාහිර පළාත තුළ මේ වන විට පාසැල් දරුවන්ගෙන් දෙමාපියන්ගෙන් විටින්විට මුදල් අයකිරීම් සිදුවේ, පළමුවන ශ්‍රේණිය, හයවන ශ්‍රේණිය සහ දොළොස්වන ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුලත්කර ගැනීමේදී මෙන්ම වෙනත් පන්තිවල අවශ්‍යතා සඳහාද දරුවන්ගේ දෙමවුපියන්ගෙන් මෙලෙස මුදල් එකතුකිරීම නිසා ඔවුන් දැඩි දුෂ්කරතාවයකට පත්ව ඇත. එබැවින් බස්නාහිර පළාත තුල දරුවන්ගේ දෙමවුපියන්ගෙන් මුදල් එකතුකිරීම (පහසුකම් ගාස්තු හැර) නතර කළ යුතුයැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි"

(යෝ/VI (1) /14/09)

### 02. ගරු ලක්ෂමන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා:

" බස්නාහිර පළාත් පාසැල් සඳහා 1 වන ශ්‍රේණියට ළමුන් ඇතුලත්කර ගැනීමේදී දරුවන් හා දෙමවුපියන් පීඩාවට පත්කරන වර්තමාන ක්‍රමවේදය වෙනස්කිරීමේ අවශ්‍යතාවය මතුව ඇත. ඒ සඳහා දරුවන් පාසලට ඇතුලත්කර ගන්නා දින සිට මාසයක් ඉක්ම යාමට පෙර සියලු පූර්වපාධු පුරවා අවසන් කිරීමත්, ආරක්ෂක අංශවල සේවයේ නියුක්ත වූවන්ගේ දරුවන්ගේ නාම ලේඛනය දරුවන් ඇතුලත් කර ගත් දිනයේ සිට සති 3 ක් ඉක්ම යාමට පෙර පළාත් සභාවට ලැබීමට සැලැස්වීමත්, පාලක පක්ෂ මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන නාම ලේඛණයට අනුව ළමුන් ඇතුලත් කර ගන්නා ක්‍රමය අහෝසි කිරීමත්, සම්මුඛ පරීක්ෂණ වලට සහභාගි වන සෑම දරුවෙකුටම ලැබෙන ලකුණු අනුව ස්ථිර ලේඛනයක් ලකුණු අනුපිළිවෙලට අනුව සකස් කිරීමත් ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පාසලට දරුවන් ඇතුලත් කිරීමට පියවර ගැනීමත් කළ යුතුයැයි ද, ඒ අනුව බස්නාහිර පළාතේ පාසැල්වල පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේ කටයුතු විධිමත් කර පාසලකට දරුවෙකු ඇතුලත් කිරීමට තිබෙන මානව අයිතිය පළාතේ ජනතාවට තහවුරු කළ යුතු යැයි ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි. "

(යෝ /VI (1) /14/10)

## XI. සභාව කල් තැබීම

2015.06.24 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

කේ. එච්. ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.